# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2121/3 – 2019 අප්‍රේල් 29 වැනි සඳුදා – 2019.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/03/W/2015/98.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.03.20 දිනැති හා අංක 2063/21 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.03.16 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 04, මෙල්බෝන් ඇවිනිව්, අංක 27හි පිහිටි සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.10.15 දිනැති ප්‍රදනය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අප්‍රේල් මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*යොමු අංකය*: IR/COM/03/W/2015/98.

## කාර්මික අධිකරණයේ දී ය.

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.

*නඩු අංකය*: ඒ/17/2018

*ඉල්ලුම්කාර පාර්ශවය*

සහ

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, අංක 27, මෙල්බෝන් ඇවනිව්, කොළඹ 04,

*වග උත්තරකාර පාර්ශවය*

අතර පවතින කාර්මික ආරාවුල සම්බන්ධ ප්‍රදනය.

## ප්‍රදානයයි

වර්ෂ 2018ක් වූ ඔක්තෝබර් මස 15 දින දී ය.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මහතා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා 2018.03.16 දින මා වෙත යොමු කොට ඇත.

එකී පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල නම්, වසර 20කට අධික කාලයක් සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අනියම් රියැදුරන් ලෙස සේවය කළ පී. එල්. ගයාන්, එච්. එම්. එම්. කුමාර, ඩී. එම්. ජේ. බණ්ඩාර සහ ජේ. එන්. එස්. ජයසිංහ යන සේවකයන් සිවුදෙනාට ස්ථිර පත්වීම් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුනට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳ ව වේ.

ඒ අනුව උද්ගතව පවත්නා ආරවුල සම්බන්ධයෙන් අදළ පාර්ශවයන්ට ඉදිරිපත් කළ හැකි සම්පූර්ණ විස්තර ප්‍රකාශයන් වර්ෂ 2018ක් වූ අප්‍රේල් මස 20 දින හෝ ඊට පෙර කාර්මික අධිකරණ ලේඛකාධිකාරී වෙත ලැබෙන සේ එවන ලෙස වර්ෂ 2018ක් වූ මාර්තු මස 22 වැනි දිනැති ලිපියක් මගින් දැනුම් දුන්න ද නිර්දේශිත කාලය තුළ කිසිදු පාර්ශවයක් ඊට ප්‍රතිචාර දක්වා නොමැත.

ඉන් ඉක්බිතිව වර්ෂ 2018ක් වූ මැයි මස 08 දිනැති ලිපියක් මගින් ද පාර්ශවයන් දැනුවත් කරමින් අදළ විස්තර වාර්තාවන් ඉදිරිපත් කිරීම සඳහා නැවත කල් ලබා දීමක් කළ ද එම දැනුම් දීම ද පාර්ශවයන් විසින් නොසළකා හැර ඇත.

එහෙයින් අදළ පාර්ශවයන් වෙත නැවත වර්ෂ 2018ක් වූ මැයි මස 31 දිනැති ලිපියක් යොමු කරමින් ඉහත සඳහන් විස්තර වාර්තා ලිපියේ දින සිට සති දෙකක් ඇතුළත ඉදිරිපත් කරන ලෙසට දැනුවත් කළ ද ඊට ප්‍රතිචාර දක්වමින් වගඋත්තරකාර පාර්ශ්වය තම පිළිතුරු ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා තවත් සති දෙකක කාලයක් ඉල්ලා තිබුණි. එහෙත් ඉල්ලුම්කාර පාර්ශවය ඊට ද කිසිදු ප්‍රතිචාරයක් දැක්වීමට සැළකිලිමත් වූයේ නැත.

ඉහත දින සඳහන් සියලු ලිපි ලියාපදිංචි තැපෑලෙන් දෙපාර්ශවය වෙතම යවන ලද අතර, විශේෂයෙන් ම පැමිණිලි පාර්ශවය එම ලිපි සියල්ලටම කිසිදු ප්‍රතිචාරයක් දක්වා නැත. ලියාපදිංචි තැපෑලෙන් එසේ යවන ලද කිසිම ලිපියක් භාර නොගත් හෙයින් ආපසු මෙම කාර්යාලය වෙත ලැබී ද නැත. එහෙයින් කාර්මික අධිකරණය විශ්වාස කරනුයේ ඒ සියලු ලිපි පාර්ශවයන් වෙත ලැබී තිබෙන බවයි.

එබැවින් බේරුම්කරණය සතුව පැවැති අවසාන වශයෙන් වූ විකල්පය වූයේ පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් හෝ එසේ නැතහොත් ඒකපාර්ශවීය වශයෙන් හෝ නඩුව විභාගයට නියම කිරීම ය. ඒ අනුව වර්ෂ 2018ක් වූ ජූලි මස 31 දිනැති ලිපියක් මගින් පාර්ශවයන් වෙත වර්ෂ 2018ක් වූ අගෝස්තු මස 15 දින ප.ව. 1.30ට කොළඹ කාර්මික අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙසට දැනුම් දෙන ලදී. එහෙත් ඊට පාර්ශවයන් කිසිදු ආකාරයකින් හෝ ප්‍රතිචාරයක් දැක්වීමට කටයුතු කර නැත.

එහෙයින් කිසිදු ප්‍රදනයකින් තොරව අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කරමි.

එල්. ආර්. සුමතිපාල,
බේරුම්කරු.

.
05 - 206

*මගේ අංකය:* IR/COM/02/2016/177.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.03.14 දිනැති හා අංක 2062/17 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.03.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් දෙහිවල, ගල්වල පාර, අංක 55හි පදිංචි මායා ජයන්ති ගුණසේකර ඇතුළු සේවකයින් 09 දෙනා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 03, ගෝල්ෆේස් ටෙරස්, අංක 25හි පිහිටි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.02.15 දිනැති ප්‍රදනය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අප්‍රේල් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*යොමු අංකය:* IR/COM/02/K/2016/02.

**කාර්මික අධිකරණයේ දී ය.**

මායා ජයන්ති ගුණසේකර මහත්මිය, ඇතුළු සේවකයින් 09 දෙනා, 55, ගල්වල පාර, දෙහිවල.

පළමු පාර්ශවය

සහ

*නඩු අංකය:* ඒ/14/2018

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

වගඋත්තරකාර පාර්ශවය

යන දෙපාර්ශවය අතර ආරවුල සම්බන්ධ ප්‍රදනය

**ප්‍රදානයයි**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය වේලාතන්ත්‍රිගේ දොන් ජෝන් සෙනවිරත්න අමාත්‍යතුමා වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2018.03.09 වන දින මා පත්කොට මා වෙත පවරා ඇත.

ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ :

''රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවය කළ මායා ජයන්ති ගුණසේකර මහත්මිය ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 09 දෙනා 1994 වර්ෂයේ එම සංස්ථාව අධිකාරියක් බවට පත්කිරීමේ දී අතිරික්ත සේවකයින් වශයෙන් සලකා නියමිත වයස එළඹෙන්නට ප්‍රථම පොදු වන්දි ක්‍රමය යටතේ සිය කැමැත්තෙන් සේවයෙන් ඉවත් වීමට කැමැත්ත ප්‍රකාශ කිරීම මත ගෙවිය යුතු වන්දි ප්‍රමාණය ගණනය කිරීමට බුළුමුල්ල වන්දි ක්‍රමය උපයෝගී කර ගැනීමෙන් ඔවුනට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔවුන්ට හිමි විය යුතු සහන මොනවා ද යන්න පිළිබඳවත්,

''සේවක අතිරික්ත පදනම මත අතිරික්ත සේවකයෙකු සේ සළකා වයස එළඹීමට ප්‍රථම ඔවුන්ට සේවක අර්ථසාධක අරමුදල් ද මුද හැර ඇති බැවින් ඔවුන්ගේ එක් එක් සේවා කාලයන් සලකා ඔවුන්ට වන්දි මුදල් හිමි ද යන්නත් පිළිබඳව වේ''

01. මායා ජයන්ති ගුණසේකර
02. කොලොන්නගේ රත්නපාල පෙරේරා
03. ක්‍රිෂ්ණා මානෙල් අන්ද්‍රාදි
04. සුජාතා අමරසිරි
05. එල්. සී. ඩී. සල්ගාදු
06. ශ්‍යාමලී මංගලිකා ද සිල්වා
07. එච්. ඒ. ටී. ප්‍රේමලාල් චන්ද්‍රසිරි
08. එන්. එච්. විමලසේන
09. සුමිත්‍රාරච්චි මානෙල් ආදීහු වෙති'' යන්නයි.

වර්ෂ 2018.08.28 දින විභාගය ආරම්භයේදීම ඉල්ලුම්කරුවන් වෙනුවෙන් කොලොන්නගේ රත්නපාල පෙරේරා, මායා ජයන්ති ගුණසේකර, සුජාතා අමරසිරි, ශ්‍යාමලී මංගලිකා ද සිල්වා යන අය පෙනී සිටි අතර වගඋත්තරකරු වෙනුවෙන් සහකාර අධ්‍යක්ෂ (නීති) ජනනි දයාරත්න මහත්මිය ද පෙනී සිටියහ.

ප්‍රථමයෙන්ම ඉහත සඳහන් යොමුවේ සඳහන් ආරවුල සම්බන්ධයෙන් යම් සමථයක් වෙත්දැයි විමසූ අතර එසේ සමථයක් නොමැති බව වගඋත්තරකාර පාර්ශවය දැනුම් දෙන ලදී.

එබැවින් විභාගය ආරම්භ කරන ලෙසට ඉල්ලුම්කාර පාර්ශවයට ආරාධනය කළෙමි. ඒ අනුව එක් ඉල්ලුම්කරුවකු වන කොලොන්නගේ රත්නපාල පෙරේරා හිටපු විශ්‍රාමික ආරක්ෂක නිලධාරි මහතා සිය සාක්ෂිය ආරම්භ කරමින් පහත කරුණු ඉදිරිපත් කරන ලදී. එනම්:

(i) තමන් 1981 වර්ෂයේ වගඋත්තරකාර පාර්ශවයේ සේවයට බැඳුණු බව,

(ii) තමන් (ii) (අ) ශ්‍රේණියට බඳවා ගත් බව,

(iii) එය වැරදීමකින් සිදුවූ බව ප්‍රකාශ කොට වගඋත්තරකරු විසින් ශ්‍රේණිය පහතට දමා ගෙවන ලද සියලු දීමනා ආපසු ලබාගත් බව,

(iv) තමා අතිරික්ත සේවකයෙක් හැටියට සලකා බුළුමුල්ල වන්දි ක්‍රමය යටතේ වන්දි මුදලක් ලබා දුන් බවත්,

(v) තමන්ගේ අර්ථසාධක අරමුදල් ද ලබාගත් බවත්,

(vi) තමා ඇතුළු අනෙකුත් 13 දෙනාම අතිරික්ත සේවකයන් ලෙස සලකා කම්කරු කොමසාරිස්තුමා දැනුවත් කළ බවත් (පැ.2 ලිපිය)

(vii) තමන් 1994 බුළුමුල්ල වන්දි ලබාගෙන සේවයෙන් ඉවත් වූ බවත් 1994 සිට අධිකාරියේ වන්දි ක්‍රම 04 හෝ 05ක් භාවිත කර ඇති බවත් 1994 වන විට සේවක අතිරික්තයක් පැවැති බව පැවසූ බවත්,

(viii) තමා සමග සේවය කළ වෙනත් සේවක මහතෙකු හමුවීමෙන් පසු තමා බේරුම්කරණයක් මගින් ලක්ෂ 2 1/2ක වන්දියක් ලබා ගත් බව තමාට ප්‍රකාශ කළ බව ද, (මෙය ප්‍රවාදක සාක්ෂියක් බැවින් වගඋත්තරකාර පාර්ශවය ඊට විරුද්ධ වන බව දන්වා සිටී.)

හරස් ප්‍රශ්නවලට මුහුණ දෙමින් මෙම ඉල්ලුම්කරු තවදුරටත්:–

(ix) 1886/06 දරන 2014.10.27 දිනැති ගැසට් පත්‍රය ප්‍රසිද්ධ වූ පසුව තමන්ට හා අනෙක් ඉල්ලුම්කරුවන්ට අදළ ආරවුල හෙළි වූ බවත් පැහැදිලි කරන ලදී.

(x) වසර 20කට අධික කාලයක් සේවයෙන් ඉවත්ව සිටි තමන්ට වගඋත්තරකාර අධිකාරිය සමග ආරවුලක් පවතින බව උක්ත ගැසට් නිවේදනය පළවූ පසුව දැනගත් බවද, පැවසීය. 2018.08.28 දින කාර්ය සටහන හා බැඳේ.

මේ අනුව වගඋත්තරකාර පාර්ශවය මෙම ඉල්ලුම්කරුවන් 09 දෙනාගේ ආරවුල කල් ඉකුත් වී ඇති සජීවී නොවන ආරාවුලක් බවට තර්ක ඉදිරිපත් කරන ලද්දෙන් දෙපාර්ශවය අතර එකිනෙකට පක්ෂ විරුද්ධ අදහස් පළ කරන්නට වූයෙන් දෙපාර්ශවයේ මත ඉදිරිපත් කොට ලිඛිත දේශන ඉදිරිපත් කරන ලෙස පාර්ශවයන්ට ඉඩ ලබාදෙන ලදී.

එයට අනුකූලව ඉල්ලුම්කරුවන්ගේ අදහස වූයේ පහත කරුණු වේ. 2018.09.20 දිනැති ඉල්ලුම්කරුවන්ගේ ලිඛිත දේශනය ඉදිරිපත් කරන ලදී:

(i) ආරවුල දෙවිධියකට ක්‍රියා කිරීමක් ගැසට් පත්‍රය අනුව තහවුරු වූ බව,

(ii) මෙම ආරවුල ඇති වූයේ රංජිත් ලියනගේ යන අයට අංක 1886/6 හා 2014.10.27 දින දරන ගැසට් පත්‍රයට අනුව වෙනත් බේරුම්කරුවකු විසින් ලබා දුන් ප්‍රදානයෙන් අනතුරුව බවත්, රංජිත් ලියනගේ යන අය 1994.07.06 දින කැමැත්තෙන් සේවයෙන් ඉවත් වීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයේ ''ගෙවන වන්දි මුදල අනාගතයේ දී මීට වඩා වැඩි වුවහොත් එම හිඟ මුදල ලබා ගැනීමට යටත්ව අත්සන් කරමි'' යන වගන්තිය ඇතුළත් කොට තිබීම හේතුවෙන් වෙනත් බේරුම්කරණයක් මගින් වන්දි මුදල් ගෙවීමට නියෝග කොට තිබීම හේතුවෙන් බව,

(iii) කම්කරු කොමසාරිස්තුමා 95/06/04 දින රංජිත් ලියනගේ යන අයට මාස 50ක වන්දියක් ගෙවන ලෙස නියෝග කර තිබීම.

(iv) රංජිත් ලියනගේ යන අය මෙන්ම අතිකුත් දස දෙනා දශක දෙක හමාරක පමණ කාලයක් පුරා නිරන්තර සටනක යෙදුන බවත්, එය සනාථ කිරීම සඳහා අදාළ ලිපි විනාශයට පත්ව ඇති බැවින් ඔප්පු කළ නොහැකි බව,

(v) 20/09/2018 දිනැති ලිඛිත දේශනයේ සහ 2018.05.17 දිනැති ලිපියෙන් ද ඉල්ලුම්කාර පාර්ශ්වය මෙම කරුණ කාලාවරෝධයට යටත් නොවන බවට කර ඇති කරුණු සැලකිල්ලට ගත් බව.

(vi) ලිඛිත දේශනයේ 04 වන පිටුවේ දක්වා ඇති නඩු එනම් State bank of India *vs* Sundaralingam නඩුව සහ ANZ GRINDLAYS Bank*Vs* Minister to Labour and Others නඩුව ද සැලකිල්ලට ගත් කළ පළමු නඩුවේ දී ''ප්‍රතිශෝධනය මත වැඩිවිය යුතු විශ්‍රාම වැටුප ඉල්ලා සිටීමත් '' දෙවන නඩුවේ දී ''පාරිතෝෂික ගෙවීමේ පදනම'' ''මත අස්ව ගිය දෙදෙනාට ගෙවන ලද දීමනාව ඉල්ලා සිටීමට'' යන කරුණු මෙහිදී සැලකිල්ලට ගැනීමට නොහැක්කේ ඔවුන් දීමනා ඉල්ලා සිටීමක් පමණක් යන්න සඳහන් වීමය. එසේ නොමැතිව ඉල්ලා සිටි මුදල් ලබා දීමට ගරු අධිකරණය නියෝග කළ බවක් සඳහන් නොවේ.

(vii) ලිඛිත දේශනයේ 05 වන පිටුවේ සඳහන් කර ඇති පරිදි ''අප ඉල්ලා සිටින්නේ අප සේවයෙන් ඉවත්ව යන අවස්ථාවේ දී අප හට හිමිවිය යුතුව තිබුණ කම්කරු කොමසාරිස්වරයා නිර්දේශ කර බේරුම්කරු විසින් ද සනාථ කර 2014.10.27 දිනැති අංක 1886/6 *අතිවිශේෂ ගැසට් පත්‍රයෙන්* ද ප්‍රකාශයට පත්කළ වන්දි මුදල අප හට ගෙවන ලෙසයි.''

ඒ අනුව Smith Adhihetty *Vs* Mercantile Investment (Pvt) Ltd (113 පිටුව) නඩුවේ කරුණු අපගේ ඉල්ලීමට අදාළ කර ගත නොහැකිය. මෙහි කම්කරු කොමසාරිස්වරයා නිර්දේශ කළ හා බේරුම්කරුවෙකු විසින් සනාථ කළ අංක 1886/6 *අතිවිශේෂ ගැසට් පත්‍රයෙන්* ද ප්‍රකාශයට පත් කරන ලද වන්දි මුදල'' යන්නෙන් මෙම ඉල්ලුම්කරුවන් 10 දෙනා වෙත වන්දි මුදලක් ගෙවීමට නියෝගයක් අධිකරණයකින් ලබා දුන් බවක් නොපෙනේ. එය වැරදි ප්‍රකාශයකි. ඉහත *ගැසට් නිවේදනය* මෙම ඉල්ලුම්කරුවන් කෙරෙහි කිසිදු බලපෑමක් නොකරයි. එය සාවද්‍ය ප්‍රකාශයක් බැවින් මෙහිදී සැලකිල්ලට නොගනිමි. මෙම *ගැසට් නිවේදනය* වෙනත් ඉල්ලුම්කරුවෙක් වෙත කරන ලද නියෝගයක්වන අතර එය රංජිත් ලියනගේ නමැති මෙම ඉල්ලුම්කරුවන් සමග සේවයේ යෙදී සිටි අයෙකු වෙත ප්‍රදානයකින් ලබා දී ඇති සහනයක් මිස මෙහි ඉල්ලුම්කරුවන් වෙත අදාළ නොවන තීරණයකි.

(viii) මෙම ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම සලකා නොබලන්නේ නම් 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ අරමුණ ඉෂ්ට නොවන බවට කරුණු ලබන තර්කය ද මෙම කරුණ හා ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම සැලකිල්ලට නොගත් විට අර්ථ ශුන්‍ය බවට කරන තර්කය ද අර්ථ ශුන්‍ය වේ. ලිඛිත දේශනයේ ආරම්භයේ ම ''රංජිත් ලියනගේ මෙන්ම වන්දි මුදල් වැඩි කර ගැනීමට ඉන් පසුව ද නිරන්තර උත්සාහයක යෙදුණ එම අධිකාරියේ සේවයේ යෙදී සිටි කවුරුත් දන්නා කරුණකි. එකී කරුණ සනාථ කිරීම සඳහා මේ වන විටත් දශක 2 1/2 පමණ කාලයක් ගතවීම හේතු කොටගෙන බලධාරීන් හා ඉල්ලුම්කරුවන් අතර හුවමාරු වූ'' ''බොහෝ ලිපි ලේඛනමය සාක්ෂි විනාශ වී ගොස් ඇතත්'' යන ඡේදයෙන් වගඋත්තරකාර පාර්ශ්වයේ මෙම ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම කාලාවරෝධයට පත්ව ඇති බවට කරන තර්කය ව්‍යංගයෙන් පිළිගැනීමක් බව පැහැදිලි වේ. වන්දි ලබා ගන්නා අවස්ථාවේ රංජිත් ලියනගේ විසින් තමා වන්දි මුදල් ලබාගන්නා අවස්ථාවේ දීම තමාට විසඳිය යුතු ප්‍රශ්නයක් පවත්නා බවට වාක්‍යාංශයක් ලිඛිතව ඉදිරිපත් කර තිබීම ඔහුගේ නඩු කාර්ය ඉදිරියට ගෙන යාමට හා තවදුරටත් සහනයක් ලබා ගැනීමට හේතුවක් ඇතත් මෙම ඉල්ලුම්කරුවන් 10 දෙනා වන්දි මුදල් ලබා නිහඬව සිට ඇත. එනිසාම ඔවුන්ට යම් දීමනාවක් ලැබීමේ ඉඩක් පැවතිය ද නිහඬව සිටීමෙන් එය ඔවුන් විසින්ම මඟ හරවා ගෙන ඇත.

තවද රංජිත් ලියනගේ නමැති අය ''ගෙවන වන්දි මුදල අනාගතයේ දී මීට වඩා වැඩි වුවහොත් එම හිඟ මුදල් ලබා ගැනීමට යටත්ව අත්සන් කරමි.'' යන සටහන යෙදීමෙන් තම නීති කෘත්‍ය අනාගතය සමග බැඳී තබා ඉන් නොනැවත කම්කරු කොමසාරිස්තුමා වෙත ද පැමිණිලි කොට 1995.06.14 බේරුම්කරණයක් දක්වා ගොස් 2013.01.16 තමාට වාසිදායක තීරණයක් ලබා ගැනීම ඔහු සමග එකට වන්දි ලබා ගත් මෙහි ඉල්ලුම්කරුවන් 10 දෙනා එකසේ බලනොපාන කරුණකි. රංජිත් ලියනගේ යන අය නිහඬව නොසිට තම ගැටළුව අවශ්‍ය තැන් වලට ඉදිරිපත් කිරීමටත් නිහඬව සිට රංජිත් ලියනගේ යම් වන්දියක් ලබා ගැනීමත් අතර වෙනස මෙහිදී සැලකිල්ලට ගතයුතු කරුණ වේ. නිහඬව සිටි පාර්ශ්වය කාලාවරෝධී නීතියට හසුව ඇත. මෙම ලිඛිත දේශනය අනුව මෙහි ඉල්ලුම්කරුවන් සඳහන් තවත් සම්ප්‍රකාශයක මෙසේ සඳහන් වේ. ''කම්කරු ආරවුල් පනතේ ආරාවුලක් කාලයක් ගිය විට කාලාවරෝධී වන බව කිසිදු තැනක සඳහන් නොවන අතර 1995 වර්ෂයේ සිට වසර 19ක් නිහඬව සිට 2014 දී එකී කම්කරු ආරවුල විභාග කර රංජිත් ලියනගේ මහතාට හිඟ මුදල් ගෙවිය නොහැක්කේ ඇයි? යන්න අප මතු කරන ප්‍රශ්නයයි''

ඊට පිළිතුර දූනටමත් ඉහතින් දක්වා ඇති බව සඳහන් කරමි. තවදුරටත් ඉල්ලුම්කරුවන්ගේ ලිඛිත දේශනයෙහි අඩංගු කරුණු සැලකිල්ලට ගත් විට

''විසඳිය යුතු කරුණු පැහැදිලිව තෝරා බේරා ගෙන සාක්ෂිකරුවන් ගෙන් සාක්ෂි ලබා ගැනීම ආදී මෙම නඩුවේ ඉදිරි පියවරයන් වෙත යන්නේ නම් මැනවි'' යන ලිඛිත දේශනයේ සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමි. ඉල්ලුම්කරුවන්ගේ ඉහත සඳහන් කරුණු පෙරදැරි කොට ගෙන 2018.08.28 දිනැති විභාගය ආරම්භ කොට ප්‍රථමයෙන් සාක්ෂි කැඳවන ලද කොලොන්න ආරච්චිගේ රත්නපාල පෙරේරා මහතා වගඋත්තරකාර ආයතනයේ ප්‍රධාන ආරක්ෂක නිලධාරි මහතාට තම පැමිණිල්ල ඉදිරිපත් කර සාක්ෂි මෙහෙයවන මෙන් ඉල්ලා සිටියෙමි. එහෙත් හරස් ප්‍රශ්නවලට මුහුණ දීමට ඒ මහතා අපොහොසත් වූයෙන් වගඋත්තරකාර පාර්ශ්වය තවදුරටත් මෙම යොමුවේ සඳහන් කරුණු ඉදිරියට ගෙන යා නොහැකි බවත් ඒ අනුව මූලික විරෝධතාවයක් ගන්නා බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී. එකී මූලික විරෝධතාවය ඉල්ලුම්කරුවන් වෙත පැහැදිලි කොට විරෝධතාවයට කරුණු ඉදිරිපත් කරන මෙන් විරෝධතාවයක් යනු කුමක් ද එයට මුහුණ දිය යුත්තේ පාර්ශවයන් පක්ෂව හා විපක්ෂව හේතු දැක්වීමෙන් බව පැහැදිලි කර දීමෙන් අනතුරුව විරෝධතාවයට විපක්ෂව කරුණු ඉදිරිපත් කරන මෙන් ඉල්ලුම්කරුවන්ගෙන් ද ඉල්ලා සිටියෙමි. ඒ අනුව මෙතෙක් සාකච්ඡා කළ කරුණු ඉල්ලුම්කරුවන් ඉදිරිපත් කළ අතර වගඋත්තරකරුවන් ද පක්ෂව කරුණු ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරුවන්ගේ ලිඛිත දේශනයන්හි ඉදිරිපත් කොට ඇති The

Colombo Apothecaries Co. Ltd *Vs* E. A. Wijesooriya 70 NLR නඩුවේ තීන්දුව මත අග විනිසුරු ඇතුළුව විනිශ්චයකරුවන් 07 දෙනෙකුගේ තීන්දුව ඉදිරිපත් කරමින් එනම් ''That the dispute between the petitioner Company and 2nd respondent was an Industrial Dispute within the Menaning of S 48 of the Industrial Dispute Act and the Minister had the power to the refer it for settlement there for had jurisdiction to hear and determine the dispute'' යන්න ඉදිරිපත් කරමින් අදට ද ''බලධාරි නීතිය'' මෙය බවත් වගඋත්තරකාර පාර්ශ්වය උදහරණ ලෙස ඉදිරිපත් කර ඇත්තේ මෙම තීන්දුවට අනුව අඩු විනිසුරුවන් සංඛ්‍යාවකින් යුත් තීන්දු බවත් මෙම තීන්දුව පූර්ණ අධිකරණයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද තීන්දුවක් හෙයින් එය බලවත් බවය.

වගඋත්තරකාර පාර්ශ්වයේ විරෝධතාවය කෙරෙහි ඉදිරිපත් කර ඇති කරුණු මෙසේය.

01. මෙම ආරවුල සජීවි ආරවුලක් නොවන බව,
02. ඉල්ලුම්කරුවන් වන්දි මුදල් 1994 දී ලබාගෙන ඇති බව,
03. රංජිත් ලියනගේ නමැති අය 1995.01.18 සිට ම වන්දි මුදල් ප්‍රමාණවත් නොවන බවට පැමිණිලි කොට තිබීම.
04. ඉල්ලුම්කරුවන් 09 දෙනා රාජ්‍ය මැණික් හා ස්වර්ණාභරන අධිකාරියෙන් වන්දි මුදල් 1994 දී ලබාගත් බව,
05. 2015.09.21 දින තෙක් තමන්ට ලැබුණ වන්දිය ප්‍රමාණවත් නොවන බවට කම්කරු කොමසාරිස්තුමා වෙත හෝ වාර්තා කළ ද, වගඋත්තරකාර අධිකාරිය වෙත කිසිදු පැමිණිල්ලක් සිදු නොකොට තිබීම.
06. එහෙත් රංජිත් ලියනගේ යන අය 1995.01.18 දින තමාට ලැබුණු වන්දි මුදල් ප්‍රමාණවත් නොවන බවට පැමිණිලි කොට අන්‍යාකාර නඩු විභාගයකින් අනතුරුව වැඩි වන්දි මුදලක් ලබා ගැනීම.
07. වසර ගණනාවක් කල් ගතව ඇති මෙම ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම වෙනත් සේවකයෙකු හට දෙන ලද තීන්දුවක් මත බලාත්මක කළ නොහැකි බව.
08. කම්කරුවකුට හෝ සේවකයෙකුට කම්කරු ආරවුලක් ඇති විය හැක්කේ තම සේවායෝජක සමඟ වුවද, මෙම ඉල්ලුම්කරුවන් වගඋත්තරකාර ආයතනයේ, සේවකයන් නොවන බවත් ඔවුන් සිය සේවයෙන් 1994 වර්ෂයේ දී වගඋත්තරකරුගේ ආයතනයේ රැකියාවෙන් ඉවත්ව වෙනත් සේවායෝජකයන්ගේ සේවකයන් බවට පත්ව සේවය කර වසර ගණනාවක් එනම් වසර 24ක් ඉක්ම ගොස් ඇති බවය.

09. එක් එක් සේවකයා වගඋත්තරකාර ආයතනයෙන් ඉල්ලා අස් වූ දින මෙසේය:–

| | |
|---|---|
| මායා ජයන්ති ගුණසේකර | 1994.07.15 |
| කොළොන්නගේ රත්නපාල පෙරේරා | 1994.04.30 |
| ක්‍රිෂ්ණා මානෙල් අන්ද්‍රාදි | 1994.05.26 |
| සුජාතා අමරසිරි | 1994.04.01 |
| එල්. සී. ඩී. සල්ගාදු | 1994.04.30 |
| ශ්‍යාමලී මංගලිකා ද සිල්වා | 1994.04.30 |
| එච්. ඒ. ටී. ප්‍රේමලාල් චන්ද්‍රසීලි | 1994.04.30 |
| එන්. එච්. විමලසේන | 1994.04.30 |
| සුමිත්‍රාරච්චි මානෙල් | 1994.08.08 |

10. රංජිත් ලියනගේ නමැති අය කරන ලද පැමිණිල්ල බේරුම්කරණ ආයතනයක් වෙත යොමු කොට ප්‍රදානයක් ඔහුගේ වාසියට 2014.07.01 දින ලබා තිබීම හා ඒ අනුව වන්දි මුදලේ අතිරික්තයක් ඔහු විසින් ලබා තිබීම.

11. රංජිත් ලියනගේ මහතාගේ බේරුම්කරන නඩු විභාගය සුවිශේෂි කරුණු මත පදනම්ව පැවති බවත් එම සුවිශේෂි කරුණු මෙම A 14/2018 නඩුවේ ඉල්ලුම්කරුවන් 09 දෙනා වෙත කෙසේවත් බලනොපාන බව.

12. රංජිත් ලියනගේ යන අය සිය වන්දි මුදල ලබා ගැනීමේ දී කොන්දේසියකට යටත්ව ලබා තිබීම විශේෂ කරුණක් ලෙස සලකා ඇති බව පැහැදිලි වන අතර මෙම සේවකයින් 09 දෙනා එවැනි කොන්දේසියක් මත වන්දි මුදල් ලබාගෙන නොතිබීම.

13. මෙම ඉල්ලුම්කරුවන් 09 දෙනා සමග සේවයෙන් වන්දි මුදල් ලබා ගත් රංජිත් ලියනගේ යන අයට තිබූ නඩු නිමිත්ත මෙම ඉල්ලුම්කරුවන් කෙරෙහි පොදු වශයෙන් බලනොපාන බව.

14. ''මෙම ඉල්ලුම්කරුවන් නව දෙනා ස්ව කැමැත්තෙන් කිසිදු කොන්දේසියකින් තොරව වන්දි ලබා ගෙන ඉවත් වූ පිරිසක් වීම. වගඋත්තරකාර පාර්ශ්වය තමාට ගෙවන ලද වන්දි ප්‍රමාණවත් නොවන බවට පැමිණිලි කිරීම නීතිය ඉදිරියේ තවදුරටත් වලංගු නොවේ.'' යන වගඋත්තරුගේ විරෝධතාවය අවසන් ඡේදයේ සඳහන් කරුණු ද පිළිගනිමි.

## ප්‍රදානය හා පසුබිම

ඉල්ලුම්කාර පළමු පාර්ශ්වය සහ වගඋත්තරකාර දෙවන පාර්ශ්වය යන දෙපක්ෂය විසින් මෙම බේරුම්කරණ විභාගය පිළිබඳව ඉදිරිපත් කළ සියලුම කරුණු සැලකිල්ලට ගතිමි.

දෙපාර්ශ්වයම මූලික විරෝධතාවය කෙරෙහි විස්තර කරන ලද කරුණු සැලකිල්ලට ගත් කල්හි ඉල්ලුම්කාර පාර්ශ්වය වෙත කම්කරු කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කළ යොමුවේ සඳහන් කරුණු කාලාවරෝධයට පත් වූවක් බව පිළිගනිමි. විශේෂයෙන් ඒ පිළිබඳව මූලික විරෝධතා ඉදිරිපත් කිරීමේ දී වගඋත්තරකාර පාර්ශ්වය ඊට පක්ෂව ඉදිරිපත් කළ කරුණු සහ ඉදිරිපත් කරන ලද ලේඛනවල අඩංගු කරුණු ද සලකා බලන කල්හි ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම කල් ඉකුත් වූ බැව් පිළිගත හැක.

"රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවය කළ මායා ජයන්ති ගුණසේකර මිය ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 09 දෙනා 1994 වර්ෂයේ එම සංස්ථාව අධිකාරියක් බවට පත් කිරීමේ දී අතිරික්ත සේවකයින් වශයෙන් සලකා නියමිත වයස එළඹෙන්නට ප්‍රථම පොදු වන්දි ක්‍රමය යටතේ සිය කැමැත්තෙන් සේවයෙන් ඉවත්වීමට කැමැත්ත ප්‍රකාශ කිරීම මත ගෙවිය යුතු වන්දි ප්‍රමාණය ගණනය කිරීමට බුළුමුල්ල වන්දි ක්‍රමය උපයෝගි කර ගැනීමෙන් ඔවුන්ට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන මොනවා ද යන්න පිළිබඳවත්, සේවක අතිරික්ත පදනම මත අතිරික්ත සේවකයෙකු සේ සළකා වයස එළඹීමට ප්‍රථම ඔවුන්ට සේවක අර්ථ සාධක අරමුදල් ද මුදහැර ඇති බැවින් ඔවුන්ගේ එක් එක් සේවා කාලයන් සලකා ඔවුන්ට වන්දි මුදල් හිමි ද යන්නත් පිළිබඳ වේ.

01. මායා ජයන්ති ගුණසේකර
02. කොළොන්නගේ රත්නපාල පෙරේරා
03. ක්‍රිෂ්ණා මානෙල් අන්ද්‍රාදි
04. සුජාතා අමරසිරි
05. එල්. සී. ඩී. සල්ගාදු
06. ශ්‍යාමලී මංගලිකා ද සිල්වා
07. එච්. ඒ. ටී. ප්‍රේමලාල් චන්ද්‍රසිරි
08. එන්. එච්. විමලසේන
09. සුමිත්‍රාරච්චි මානෙල් යන ඉල්ලුම්කරුවන්

දෙපාර්ශවයේ කරුණු සැලකිල්ලට ගෙන ඉහත යොමුවේ සඳහන් කරුණු සජීවී කරුණක් නොවන බවට පිළිගනිමි. මේ කරුණු සලකා බේරුම්කරණ විභාගය නතර කිරීමට තීරණය කරමි.

**ප්‍රදානය:–**

ඉහත කී යොමුවේ සඳහන් ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයේ වාසියට තිරණයක් (ප්‍රදානයක්) ලබාදීමට තරම් යෝග්‍ය පසුබිමක් නොමැත. හේතුව වගඋත්තරකාර දෙවන පාර්ශ්වයේ තර්ක පිළිගැනීමට සිදුවීමය. විශේෂයෙන් ම නඩු නිමිත්ත කාලාවරෝධයට පත්ව ඇති බැවි බිඳිය නොහැකි තර්කය මා විසින් ද පිළිගනිමි. එසේ පිළිගැනිමේ දී ඉල්ලුම්කරුවන් 09 දෙනාගේ වන්දි ප්‍රමාණය ගණනය කිරීමට බුළුමුල්ල වන්දි ක්‍රමය උපයෝගි කර ගැනීමෙන් ඔවුන්ට යම් අසාධාරණයක් සිදු වූයේ දැයි විභාගයක් පවත්වා සාධාරණ කරුණු ඉස්මතු කර ගැනීමට කාලාවරෝධීව පවත්නා යොමුවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සැලකිලිමත් වීමට තරම් නොවන බව මාගේ අපක්ෂපාති තිරණයයි. එසේ හෙයින් යොමුවේ සඳහන් ඉල්ලීමට එනම් ඔවුනට අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා එසේ අසාධාරණය් සිදුවී තිබේ නම් ඔවුනට හිමිවිය යුතු සහන මොනවාද යන්නට පිළිතුරු සපයා ගත නොහැකි වූයේ යොමුවේ සඳහන් කරුණු විභාගයකින් තොරව ආනුශාංගික කරුණු මත වගඋත්තරකාර පක්ෂයේ ඉල්ලීම පරිදි ඉවත දැමීමටත් විධිමත් ආකාරයට විභාගය නොපැවැත්වීම මත ප්‍රදානයක් නොදීමටත් තීරණය කරමි.

මෙය යුක්ති සහගත හා අපක්ෂපාතී තීරණයකි.

2019 පෙබරවාරි මස 15 වැනි දින,
බේරුම්කරණ අධිකරණයේ දී ය.

මෙයට,
එස්. කාරියවසම්,
(බේරුම්කරු.)

.
05 - 207

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.